**නුවරඑළිය මහා නගර සභාව - 2022**
**------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නුවරඑළිය මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උපචිත පදනම මත ආදායම් වියදම් ඉදිරිපත් කරන බව මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර තිබුණද, සියළු ආදායම් හා වියදම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | බිල් කිරීම් වලින් ලබාගන්නා ආදායම් පමණක් මුදල් පදනම මත ගිණුම් ගත කර ඇති අතර අදාළ ආදායම් වියදම් වල වෙනස් වීම් අත්හැරීම් දෝෂ ලෙස සලකා ජ'නල් සටහන් මගින් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව | උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ රු.387,887 ක ආයෝජන පොලී සමාලෝචිත වර්ෂයේ ආදායම් සේ ගිණුම් ගත කර තිබුණි. | විගණනය විසින් පෙන්වා දුන් පරිදි ඉදිරි වර්ෂයේදී කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි අගයන් දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු. 460,675 කට මිළදී ගෙන තිබුණු යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයට අදාළ සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු.444,000 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ විගණන ගාස්තුව හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂවල නිරවුල් කරන ලද එකතුව රු.7,463,319 ක කර්මාන්ත ණයහිමි ශේෂයන් තවදුරටත් වියදම් ණයහිමියන් යටතේ දක්වා තිබු අතර සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂයේ අවස්ථා 25 කදී ගෙවීම් කරන ලද රු.3,559,315ක් සමාලෝචිත වර්ෂයේ වියදම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු වාහන 03 ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස්කිරීමේදී නිවැරදි කරන බව | වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති නිරවුල් නොකරන ලද රු.705,360 ක ලැබිය යුතු වෙළඳ බලපත්‍ර නඩු ගාස්තු ගිණුම් වලින් අතහැරී තිබුණි. | 2023 වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ලෙස පිළියෙල කළ යුතුය. |

**1.6.3 අධිකාරි බලය නොලත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන ආ කඩකුලී පොත් ශේෂය හා පරිගණක මෘදුකාංග පද්ධතියේ ශේෂය අතර වෙනස ගැලපීම් කිරීම සඳහා ජ'නල් සටහන් අංක 34 හා 35 මඟින් පිළිවෙලින් රු.3,493,572 ක් හා රු.2,527,557 ක් සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණද, මෙම ගැලපීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරියේදී කරුණු ඉදිරිපත් කරන බව | ගිණුම් ශේෂ ගැළපීම් සඳහා අනුමැතිය ලබාගත යුතුය. |

**1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,085,827 ක් වූ ගිණුම් ශේෂ 03 ක් උපලේඛන හා ශේෂ සනාථ කිරීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | පරීක්ෂා කර බලා ඉදිරියේදී කරුණු ඉදිරිපත් කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කිරීමට තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත | | | |
| (i) | II කොටස ප්‍රචාරක දැන්වීම් අතුරු ව්‍යවස්ථාවේ | ඉකුත් වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දක්වා දැන්වීම් පුවරු 198 ක් සඳහා රු. 9,996,467 | අඩුපාඩු කරමින් ඉදිරි සිදු කිරීමට කටයුතු | නිවැරදි බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (a) 01 ඡේදය | ක ගාස්තු අය කර තිබුණද ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. | කරන බව | |
| | (b) 1 (ඔ) ඡේදය | ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු 646 කින් සමාලෝචිත වර්ෂය තුළදී රු.5,693,668 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | සභා අනුමැතියට යොමුකර ඇති බව | ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | II වන බණ්ඩය XVIII මොටර් වාහන නතර කර තැබීමේ අතුරු ව්‍යවස්ථාවේ 08 ඡේදය | 2022 අගෝස්තු 18 පරික්ෂා කරන දිනට ගාස්තුවක් ගෙවා ලබාගන්නා අවසර පතක් නොමැතිව රථගාල් 04 ක වාහන 67 ක් ගාල් කර තිබුණි. | රථගාලක නවතා තබන වාහන සඳහා අදාළ රථ වාහන ගාස්තු අයකරන ලෙස සේවක මහතුන් දැනුවත් කර ඇති බව | වාහනවලින් ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XIX පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | සභාවට අයත් උපලේඛනගත නිවාසයක පදිංචි නිලධාරියෙකුගෙන් 2016 ජුලි සිට 2017 අගෝස්තු කාලය තුළ රු. 62,509 ක නිවාස කුලී අයකර නොතිබුණි. | මේ සම්බන්ධව හිටපු නාගරික කොමසාරිස් වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව | හිඟ නිවාස කුලිය අයකළ යුතුය. |
| (ii) | XXIV පරිච්ඡේදයේ 4.2.5 හා 4.5 වගන්ති | මියගිය හා විශ්‍රාමගිය නිලධාරීන් 26 ක්, වැඩ තහනමට ලක්වූ නිලධාරි 11 ක්, සේවය හැරගිය නිලධාරි 17 ක් හා ස්ථාන මාරු වී ගිය නිලධාරින් 21 දෙනෙකුගේ රු. 3,523,866 ක ණය ශේෂයන් අයකර නොතිබුණි. | ණය ශේෂ අය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව | හිඟ ණයශේෂ අයකළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහ | | | |
| (i) | මු.රෙ. 137 (5) | භාණ්ඩ මිළදී ගැනීම සඳහා 2018 වර්ෂයේදී රාජ්‍ය සමාගමකට ගෙවා තිබුණු මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.275,805 ක භාණ්ඩ ලැබී නොතිබුණි. | භාණ්ඩ සභාව වෙත ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව | ගෙවීම් වලට අදාළ භාණ්ඩ ලබාගත යුතුය. |
| (ii) | මු.රෙ. 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ කාලය ඉකුත් වූ රු. 2,394,582 ක චෙක්පත් 30 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොවූ අදාළ චෙක්පත් ආදායමට ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ.571 | ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු | නැවත පරීක්ෂා කර බලා නිවැරදි කිරීම් සිදුකරන | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිබඳ අවධානය යොමු නොකර බව ශේෂය රාජ්‍ය ආදයමට නොගත යුතු නිෂ්කාශනය නොවූ චෙක්පත්, නාගරික සංවර්ධන අධිකාරියේ තැන්පත්, නඩු තීන්දු මත වූ තැන්පත් එකතුව රු.3,265,096 ක ශේෂ ආදායමට ගෙන තිබුණි. | | |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය | අවස්ථා 10 කට අදාළව මාස 01 සිට වසර 08 ක කාල පරාසයක සිට නොපිය වූ අත්තිකාරම් රු.1,960,650 ක් විය. | මේ පිළිබඳ මූලික විමර්ශනයක් සිදු කරන බව | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 16 (2) | සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව | කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.219,928,379 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.130,904,874 ක් විය.

**2.2. මූල්‍ය පාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම ගිණුම් 02 කට අදාළ සමාලෝචිත වර්ෂය අවසන් දිනට බැංකු සැසඳුම් වාර්තාවල දක්වා තිබුණු හඳුනා නොගත් ලැබීම්, සෘජු තැන්පතු හා බැංකු ගාස්තු එකතුව රු.5,509,725 ක් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | මුදල් පොතට ගැලපීමට ඉදිරියේදී කටයුතු කරන බව | අදාළ ශේෂයන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේදක්වා වසර 08 ක කාලයක් තුළ අවස්ථා 14 ක දී ආදායම් වශයෙන් ලැබී අගරු වී ඇති රු.1,100,834 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | මෙම අගරු වී ඇති චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 139,912,400 | 129,038,341 | 138,880,404 | 124,723,544 | 147,257,700 | 113,114,777 | 123,149,826 | 134,565,609 |
| (ii) | කඩ කුලී | 78,955,000 | 58,864,187 | 56,869,600 | 73,329,599 | 81,466,154 | 63,380,926 | 71,671,502 | 71,335,012 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 19,807,000 | 23,595,274 | 17,610,877 | 27,280,075 | 21,554,750 | 20,144,177 | 16,141,310 | 21,295,678 |
| (iv) | වෙනත් ආදායම් | 465,849,100 | 54,395,698 | 45,294,666 | 47,561,373 | 465.866,558 | 33,042,066 | 318,456,705 | 38,460,341 |
| | | 704,523,500 | 265,893,500 | 258,655,547 | 272,894,591 | 716,145,162 | 229,681,946 | 529,419,343 | 265,656,640 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| i. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ගිණුමේ ශේෂය රු.78,266,493 ක් වූ අතර මින් පෞද්ගලික දේපලවලින් අයවිය යුතු වරිපනම් හිඟය රු.63,220,565 ක් විය. එයින් රු.56,744,559 ක් වරිපනම් පරිශ්‍ර 3875 කින් වසර 01 සිට වසර 10 ට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | සියළු කොට්ඨාශ ආවරණය කරමින් හිඟ වරිපනම් බදු අය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතින බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| ii සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉඩම් බදු හිමියන් 171 දෙනෙකුගෙන් රු.17,523,980 ක ශේෂයක් අයවිය යුතුව පැවති අතර වසර 01 ට වැඩි හිඟ ශේෂය රු.16,633,980 ක් විය. තවද, වසර 25 ට වැඩි හිඟ ශේෂ තුළ රු.50,000 වැඩි හිඟ බදු ශේෂ සහිත ඉඩම් බදු හිමියන් 09 දෙනෙකුගෙන් රු.2,932,032 ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ඉඩම් බදු හිමියන් වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු සිදු කර ඇති බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුලී<br>----- | | |
| i. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කඩ 442 කින් රු.38,813,255 ක හිඟයක් පැවති අතර ඒ තුළ කඩ 212 කින් වසර 03 ට වැඩි කාලයක සිට හිඟව පැවති ශේෂය රු.35,365,655 ක් විය. | මෙම වර්ෂය තුළ හිග කඩ කුලී අය කර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශ්‍රෙගරි කඩකුලී රු.2,678,288 ක හිඟයක් පැවති අතර ඉන් වසර 01 ත් 05 ත් අතර කාල පරාසයක් තුළ අයවිය යුතු ශේෂය රු.2,183,228 ක් විය. | කෝවිඩ් 19 වසංගත කාල සීමාව තුල ආදායම් උත්පාදනය කිරීමට නොහැකි වූ බව දන්වා බිල් කිරීම් කපා හරින ලෙසට ඉල්ලීමක් කර ඇත. | - එම - |
| iii. | වාර්ෂිකව බදු දුන් දේපල වලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු බදු කුලී රු.11,358,981 ක් වූ අතර ඉන් දේපල 05 කින් වසර 05 ට වැඩි ශේෂ රු.3,010,396 ක් පැවතුණි. දේපල 03ක රු.7,954,499 ක් වසර 01 ත් 05 ත් අතර කාලයක හිඟ පැවතුණි. | ඉදිරියේදී අයකර ගන්නා බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| iv | වික්ටෝරියා උද්‍යානයේ නව ආපනශාලාව 2011 මාර්තු 15 දින සිට වසර 10 කට බදුදීමට කටයුතු කර තිබුණු අතර 2021 වර්ෂයේ මාර්තු 14 දින ගිවිසුම් කාලය අවසන්ව පැවතියද, ගිවිසුම් අලුත්කරවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එදිනට එකතුව රු.2,241,319 ක බදු කුලී අයකරගෙන ද නොතිබුණි. | හිඟ ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරන බව | - එම - |
| (ඇ) | බලපත්‍ර ගාස්තු<br>----------------- | | |
| i. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වාර්ෂික බලපත්‍ර ගිණුමේ හිඟ ශේෂය රු.23,682,206 ක් වූ අතර එයින් රු.23,678,766 ක් වසර 01 සිට වසර 20 වැඩි කාලයක සිට බදුකරුවන් 473 කගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ලිඛිතව දන්වා ඇති බව | - එම - |
| ii. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් බදු හිමියන් 171 දෙනෙකුගෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු රු.17,523,980 ක් අයවිය යුතුව පැවති අතර ඉන් වසර 01 ට වැඩි හිඟ ශේෂය රු.16,633,980 ක් වූ නමුත් හිඟ ගාස්තු අයකර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ඉඩම් බදු හිමියන් වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු සිදු කර ඇති බව | - එම - |
| iii. | මහා නගර සභා ආඥා පනතේ 247 (අ) වැනි වගන්තිය අනුව බලපත්‍ර නිකුත් කිරීමේදී වාර්ෂික තක්සේරු වටිනාකම රු.2500 ඉක්ම වන විට වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.5000 ක් අයකළ යුතු නමුත් වාර්ෂික වටිනාකම 2500 ට වැඩි ව්‍යාපාරික ස්ථාන 139 කින් රු.5,000ට අඩු වෙළඳ බලපත්‍ර | 2023 වර්ෂයේ සිට අයකිරීමට කටයුතු කර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගාස්තුවක් අය කර තිබුණි. ඒ හේතුවෙන් සභා අරමුදලට රු.353,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | | |

(ඇ) වෙනත් ආදායම්

------------------

| | | | |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු බෝට්ටු ආදායම් ගිණුමේ ශේෂය රු.18,632,011 ක් වූ අතර එම ශේෂය තුළ හිඟය රු.500,000 ට වැඩි බෝට්ටු හිමියන් 09 දෙනෙක්ගෙන් රු.15,087,072 ක ශේෂයක් අයකරගෙන නොතිබුණි. | හිඟ බෝට්ටු කුලී අය කර ගැනීම සඳහා ලිඛිතව දැනුවත් කර ඇති බව | හිඟ ආදායම් අයකර ගත යුතුය |
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.28,833,071 ක් වූ අතර එයින් රු.14,811,076 ක මුදලක් වසර 01 සිට වසර 10 ට වැඩි කාලයක් සිට ජල පාරිභෝගිකයින් 1541 ක ගෙන් අයකර ගෙන නොතිබුණි. | ජල ගාස්තු නොගෙවා ඇති, ජල සම්බන්ධතා විසන්ධි කිරීම් අඛණ්ඩව සිදු කරන බව | - එම - |

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.426,379 ක් හා මුද්දර ගාස්තු රු.47,127,786 ක් විය. | අයවීමට ඇති හිඟ මුද්දර ගාස්තු එවන මෙන් මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇති බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞඛ්‍ය අංශය වෙනුවෙන් පසුගිය අවුරුදු 5 තුළ වැඩසටහන් 11 ක් වෙනුවෙන් වෙන්කළ රු.111,450,200 ක ප්‍රතිපාදන කිසිදු වියදමක් නොදරා නිෂ්කාර්යයව රඳවා තබා තිබුණු අතර වැසිකිළි ඉදි කිරීම, අවමංගල්‍යාගාරයක් ඉදි කිරීම, වාහන මිලදී ගැනීම, මළාප්‍රවාහන පද්ධති අළුත්වැඩියාව නඩත්තුව වැනි ව්‍යාපෘති ක්‍රියාවට නංවා නොතිබුණි. | හිඟය හා මිළ ඉහළ යාම හේතුවෙන් සියළු සංවර්ධන කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු විය. | ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු නිමකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කසළ කළමනාකරණය යටතේ කානු හා ඇළ මාර්ග 107 ක් නඩත්තුව හා වැඩි දියුණු කිරීම සඳහා රු.15,000,000 ක ප්‍රතිපාදන අයවැයෙන් වෙන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉන් 93 ක් ඉටු නොකර ප්‍රතිපාදන රු.12,110,812 ක් ඉතිරි කර තිබුණි. | 2023 වසරේ සිට නව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු සිදු කරන බව | කාණු හා ඇල මාර්ග පිරිසිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහන සඳහා 2018 සිට 2022 කාලයට අදාල සිවු අවුරුදු සැලැස්ම තුළ යෝජනා 158 ක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර තිබුණද, වසර 04 තුළ ක්‍රියාවට නංවා තිබුණේ සැලසුම් කළ ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 52 ක් පමණි. ඒ අනුව සැලසුම් කළ ව්‍යාපෘති 106 ක් ක්‍රියාත්මක නොකර තිබුණු අතර සැලසුම් නොකළ ව්‍යාපෘති 48 ක් සඳහා රු.40,885,340 ක වැයකර ක්‍රියාවට නංවා තිබුණි. | ස්වභාවික විපත්, ගංවතුර වැනි ආපදා තත්වයන් ඇති වීමේදී එම ලබාදුන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවී ආපදා තත්වයන් වලක්වා ගැනීම සඳහා ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමට සිදුවන අවස්ථා ඇති අතර සභාවේ මූල්‍ය තත්වයන් මත සමහර විශාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව | අනුමත සැලසුම් ක්‍රියාවට නැංවිය යුතුය. |
| (ඈ) | සිව් අවුරුදු සැලසුම් මඟින් ඉටු කිරීමට අනුමත කරන ලද දිරාපත් පැරණි නල මාර්ග සඳහා නව නල මාර්ග ඉදිකිරීම, ක්ලෝරීන්කරණ පද්ධතිය වැඩිදියුණු කිරීම, නඩත්තු පාලනය, ජල පරික්ෂණාගාරයක් ඉදිකිරීම, ජල උත්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, ජල වැටලීම් සිදු කිරීම, බෲස්ටර් පොම්පාගාරයක් ඉදිකිරීම, වැනි කාර්යයන් 09 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පුනරාවර්තන අය හා වැය ශීර්ෂයන් යටතේ ඒ ඒ වැය දැරීම් සිදුකර ඇති බව | සැලස්මට අනුකූලව ක්‍රියාකළ යුතුය. |
| (ඉ) | 2017 වර්ෂයේ රු.12,087,162 ක් වැයකර ක්‍රියාත්මක කරන ලද සූර්ය බල විදුලි පහන් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 23 දින විදුලි අංශ නිළධාරි සමඟ සිදුකළ ක්ෂේත්‍ර නියැදි පරීක්ෂාවේදී පරීක්ෂාවට ලක්වු වීථි පහන් කණු 35 ක් අතුරින් වීථි පහන් කනු 18 ක බැටරි හා, සූර්ය පැනල් 11 ක් අස්ථානගතවී තිබුණි. වසර තුනක වගකීම් කාලයක් සහිත බැටරි නගර සභා සේවකයන් විසින් ගලවා ඉවත් කර ගිවිසුම් ගත සමාගමේ ගිවිසුම් කාලය තුළ විකල්ප නොයෙදීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථකව පැවතුණි. | මෙහි බැටරි අස්ථාන ගතවීම සම්බන්ධව නුවරඑළිය පොලිස් ස්ථානය මඟින් විමර්ශන සිදුකරමින් පවතින බව | වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1991 සිට 2018 දක්වා කාලය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මෝටර් වාහන 11 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වාහන සියල්ල තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු වෙත ලිපි යොමු කර ඇති බව | වාහන තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී සෞඛ්‍ය නිර්දේශ සඳහා සෞඛ්‍ය අංශය වෙත 2022 ජනවාරි 04 දින සිට 2022 සැප්තැම්බර් 08 දින දක්වා භාරදුන් ඉල්ලුම් පත්‍ර 496 කින් ඉල්ලුම් පත්‍ර 388 ක් නිර්දේශ කර ආපසු භාරදී නොමැති අතර ඉල්ලුම් පත්‍ර 108 ක් මාස 02 සිට මාස 09 ක කාලයක් ප්‍රමාද වී භාර දී තිබුණි. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව වෙළඳ බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව | ප්‍රමාදයකින් තොරව නිර්දේශ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හාවාඑළිය හා උඩුපුස්සැල්ලාව පාර ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයෙන් 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු ටෙන්ඩර් ගාස්තු එකතුව රු.801,218 ක්, අය කර නොතිබුණි | අයකර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු කුලී/ ගාස්තු අයකළ යුතුය. |
| (ඈ) | උඩපුස්සල්ලාව පාරේ ප්‍රධාන කාර්යාලයට යාබදව ඇති කඩ කාමර 16 ක් ප්‍රාදේශීය වශයෙන් මිළ කැඳවා මහා නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන් වෙත දීර්ඝ කාලීනව බදු පදනම මත ලබාදීමට 2014 අප්‍රේල් 07 දින මහා සභාවේදී තීරණය කර තිබුණද, කඩ කාමර 02 ක් මහා නගර සභා සීමාවෙන් බැහැර පුද්ගලයින්ට ලබා දී තිබුණි. කඩහිමියන් තිදෙනකු මහනගර සභා සීමාවෙන් පිටත පුද්ගලයින් වෙත ඔවුන්ගේ ඇටෝර්නි බලය පවරා තිබුණි. බදුකරුවන් 12දෙනෙකු විසින් ගිවිසුම්ගත ව්‍යාපාරයට පරිබාහිරව වෙනත් වෘත්තීන් හා වෙළඳාම් සිදු කර තිබුණු අතර, කඩ කාමර 10 ක් රු.30,000 සිට රු.60,000 දක්වා මුදලකට අතුරු බදු දී තිබුණි. එක් කඩ කාමරයක් සඳහා බදුකරු ප්‍රකාශන ඔප්පුවක් ද සකස් කරවාගෙන තිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂා කර කටයුතු කරන බව. | අතුරු බදු කරුවන් ඉවත් කර නීත්‍යානුකූලව කඩ කාමර පැවරිය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ රු.1,153,701 ක නඩු ගාස්තු ගෙවා තිබුණු අතර, සභාවට විරුද්ධව හා සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහි පනවන ලද නඩු සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | නඩු සම්බන්ධ තොරතුරු ලේඛනගත කර පවත්වාගත යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 23 දින ක්ෂේත්‍ර පරීක්ෂණවලදී මීටර් 100 ක් දිගින් හා මීටර් 1.8 සිට මීටර් 2.4 උසකින් යුතුව ගෝල්ෆ් ක්‍රීඩාපිටිය වටා අනවසර බැම්මක් හා ග්‍රේබියන් බැම්මක් සැලසුම් කමිටු අනුමැතියකින් තොරව ඉදිකර තිබුණි. | දීර්ඝ සති අන්තයකදි ඔවුන් විසින් එම ස්ථානයේ මායිම් තාප්පයක් ඉදිකිරීමට කටයුතු කර ඇති බව | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 සිට සභාවට ලැබී තිබුණු වාහන 03 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.5,578,000 ක මෝටර් රථ 07 ක් හා අබලි තත්ත්වයේ පවතින වටිනාකම තක්සේරු නොකළ මෝටර් රථ 02 ක් නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | දැනටමත් අබලි තත්වයේ පවතින බැවින් රජයේ තක්සේරුවක් ලබා ගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරන බව | අපහරණය කිරීමට හෝ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. 5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තනතුරු 33 ක පුරප්පාඩු 121 ක්ද, තනතුරු 03 ක අතිරික්ත 47 ක්ද, පැවතුණි. | පළාත් පාලන කොමසාරිස් හා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගෙන් ඉල්ලීමක් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 02 සිට සියයට 25 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 9 සිට සියයට 90 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් හා රු.52,516,800 ක ප්‍රාග්ධන ව්‍යාපෘති 40 ක වියදම ශුන්‍ය වූ බැවින්ද අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ආර්ථික අර්බුදය මත රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් අදාළ සැලසුම් කළ පරිදි කටයුතු ඉටු කිරීමට නොහැකි බව | අවශ්‍යතාවය හඳුනාගෙන අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් කසළ කළමනාකරණ සැලසුමක් පිළියෙල කර නොතිබුණු අතර, වර්ෂයකට ටොන් 5931 ක පමණ දිරණ කසළ එක්රැස්කර කාබනික පොහොර නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු නොකර සඳතැන්න කසළ අංගනයට බැහැර කර පස් දමා වසා දැමීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. | 2023 වසරේ සිට නව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරන බව | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | තලගල ඔයේ අපද්‍රව්‍ය සෘජුව ග්‍රෙගරි වැවට බැහැර වන බව නිරීක්ෂණය වූ අතර මෙම අපද්‍රව්‍ය සහිත අප ජලය පිරිපහදුවකින් තොරව බැහැර කිරීම නිසා ග්‍රෙගරි වැව දූෂණයවීමෙන් එහි වෙසෙන ජලජ පැළෑටි හා ජලජ ජීවීන්ට තර්ජනයක් වී පැවතුණි. | තලගල ඔයෙන් බැහැරවන ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව | අපජල පිරිපහදු කළ යුතුය. |

**4.3 තිරසර සංවර්ධන අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ඉලක්ක පිහිටුවා නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකඟ වන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |